| | | |
|---|---|---|
| **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** | | |
| **තෙවන වාර පරීක්ෂණය - 2018** | | |
| **දේශපාලන විද්‍යාව(23) - II** | **12 ශ්‍රේණිය** | **කාලය පැය තුනයි** |

**<u>II පත්‍රය</u>**

- ❖ **A කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- ❖ **B හා C කොටස් වලින් ප්‍රශ්න 2 බැගින් තෝරා ගෙන ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සපයන්න.**

**(ලකුණු 20 x 2)**

## A කොටස

1. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර ඇති වෙනස්කම් 2 ක් වනුයේ

……………………………………………………………………………………………………...

……………………………………………………………………………………………………..

2. පහත දක්වෙන්නේ එකිනෙකට වෙනස් ආණ්ඩු ක්‍රමයන් දෙකක හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ කිහිපයකි. එම ආණ්ඩු ක්‍රම පිළිවෙලින් දක්වන්න.

i. තනි පුද්ගලයෙකු අත ඒකරාශි කරන ලද අසහාය බලය සමග පාලකයා හිතුවක්කාරී ලෙස සංවරණයකින් තොරව රාජ්‍ය බලය ක්‍රියාවට ගන්වයි. එමෙන්ම එක් පක්ෂයක අසහාය නායකත්වයක් පවතී.

……………………………………………………………………………………………………

මෙම ක්‍රමය තුළ රාජ්‍ය පාලනය කරන ආර්ථිකයක් ඇති අතර සහතික කරන ලද සිවිල් නිදහස් පුද්ගල අයිතිවාසිකම් සහ ජන මාධ්‍ය නිදහසක් පවතී. අනෙක් අතට ශක්තිමත්ව සංවිධානය වූ කණ්ඩායම් ක්‍රියාකාරීත්වයට හා විවිධ ආශාවන්ට නිදහස සහිත ශක්තිමත් සිවිල් සමාජයක ක්‍රියාකාරිත්වය පවතී.

I. ……………………………...…….. II. ……………………………………………..….

3. මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා අවිධිමත් අවස්ථා 02 ක් සඳහන් කරන්න.

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

4. සමාජ සම්මුති න්‍යාය තුළ ජනතා බලය සාධාරණීකරණය කළ දාර්ශනිකයන් දෙදෙනා කවුරුන්ද සඳහන් කරන්න.

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

5.

- ප්‍රකෘති සමාජයේ මිනිසුන් කෲර අධම මෙන්ම කාලකන්නි වන මෘගයින් වැනි කොටස්ය. ඔවුන්ගේ ජීවිත කෙටිය. මරණය අස්වාභාවිකය.
- මෙම සමාජයේ මිනිසුන් ඉතා සාමකාමී මෙන්ම අහිංසක අයයි.
- ඔවුන් විසින් ඇතිකරගත් එකඟතාවයක් තුළින් ප්‍රකෘති සමාජයෙන් මිදී අලුත් සමාජ ක්‍රමයට ප්‍රවිෂ්ඨ වේ.

i. ඉහත සඳහන් ප්‍රකෘති සමාජ ක්‍රම දෙක කියවෙන දේශපාලන න්‍යාය සහ

…………………………………………………………………………………………………

ii. ඉහත ආකෘතීන් ඇතුළත් සමාජය නිර්මාණය කළ චින්තනයන් දෙදෙනා පිළිවෙලින් නම් කරන්න.

…………………………………………………………………………………………………

…………………………………………………………………………………………………

6. පහත දැක්වෙන්නේ එකිනෙකට වෙනස් සංවිධාන දෙකක් තුළ දැකිය හැකි විශේෂිත ලක්ෂණ කීපයකි. එම ලක්ෂණ හඳුනාගෙන ඊට අයත් සංවිධාන දෙක පිළිවෙළින් නම් කරන්න.

i. මීට අසහාය බලයක් හිමි නොවූව ද තම සාමාජිකයන්ගේ වරප්‍රසාද කප්පාදු කිරීමේ හැකියාවක් පවතී. සාමාජිකත්වය සඳහා සීමාවක් නොපවතී. භූමි ප්‍රමාණයක් අවශ්‍ය නොවූවත් තම කැමැත්ත මත ඕනෑම තැනක ව්‍යාප්ත වීමේ හැකියාවක් පවතී.

…………………………………………………………………………………………………

ii. මේ සඳහා අසහාය මෙන්ම උත්තරීතර බලයක් හිමිවේ. නව සාමාජිකයන් සම්බන්ධයෙන් ඕනෑම තීරණයකට ඒමේ තනි සහ අනන්‍ය බලයක් භුක්ති විඳී.

…………………………………………………………………………………………………

7. ප්ලේටෝ විසින් රචනා කළ කෘතීන් 02ක් නම් කරන්න.

…………………………………………………………………………………………………..

…………………………………………………………………………………………………..

8. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ඒබ්‍රහම් ලින්කන්ගේ සහ මැක් අයිවර්ගේ නිර්වචනයන් සඳහන් කරන්න.

…………………………………………………………………………………………………..

…………………………………………………………………………………………………..

…………………………………………………………………………………………………..

…………………………………………………………………………………………………..

9.

i. අණ දීම, තහනම් කිරීම සහ හිමිකම් දැක්වෙන විධි විධාන පද්ධතියක් වන මෙය රාජ්‍යයේ කැමැත්ත ප්‍රකාශ කරන මාධ්‍ය වේ. පිළිපැදීම අනිවාර්ය වන අතර සමත්වීම තේරීමකට ලක් කිරීමට පුරවැසියන්ට හිමි කමක් නොමැත.

ii. මිනිසෙක් වීම නිසාම මිනිසාට හිමිවන මේවා විශ්වීය ස්වරූපයක් ගනී. මානවන්ගේ ආත්මගරුත්වයට හා පැවැත්මට අවශ්‍ය වන බැවින් ඒවා නීතියෙන්ම ස්ථාපිත කොට ඇත.

ඉහත දක්වා ඇති ලක්ෂණ අන්තර්ගත දේශපාලන සංකල්ප දෙක පිළිවෙලින් නම් කරන්න.

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

10. ආණ්ඩුවක බලය සංවරණය කරන නීතිමය මාර්ගයක් හා නීතිමය නොවන මාර්ගයක් දක්වන්න.

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

11. බලය බෙදීම පදනම් කොට ගෙන නූතන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි ක්‍රියාත්මක වන ආණ්ඩු වර්ග දෙක නම් කරන්න.

I. …………………………………… II. ……………………………………

12. මෙය ආණ්ඩුව හා රාජ්‍ය පිළිබඳ හදරන්නක් වන අතර, කවුරුන් කුමක් කුමන අවස්ථාවකදී ලබා ගන්නවාද යන්න පිළිබඳ තීරණය කිරීමේ අධ්‍යයනයකි.
බල අරගලය ක්‍රියාවට නන්වන්නේ මේ මගින් වන අතර, කවුරුන් කුමන අවස්ථාවකදී ලබා ගන්නවාද යන්න තීරණය වීමේ ක්‍රියාදමයකි.

ඉහත ප්‍රකාශ දෙක අන්තර්ගත කළ යුතු විෂයයන් දෙක පිළිවෙලින් නම් කරන්න.
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

13. පහත දැක්වෙන ආණ්ඩුක්‍රම දෙකෙහි ලක්ෂණ හඳුනාගෙන එම ලක්ෂණ ආණ්ඩුව ඇතුළත් ආණ්ඩු ක්‍රම දෙක පිළිවෙලින් නම් කරන්න.
i. එක් බල මධ්‍යස්ථානයක් පදනම් කොට ගෙන ගොඩනැගී ඇති මෙවැනි ආණ්ඩුව, ඒකීය අධිකරණ ක්‍රමයක්, සහ ඒකීය පරිපාලන ක්‍රමයක් පවත්වාගෙන යයි.
ii. මෙම ක්‍රමය තුළ එක් බල මධ්‍යස්ථානයක් වෙනුවට බල මධ්‍යස්ථාන කීපයක්ම ඇති අතර, මධ්‍යයේ බල ආයතනයට වඩා පරිධියේ බල අධිකාරය ඉහළ මට්ටමක පවතී.

…………………………………………………………………………………………
…………………………………………………………………………………………

14. සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි ව්‍යවස්ථාදායකය හැඳින්වූ නිල නාමය සහ සෙනෙට් මණ්ඩලයේ සංයුතිය දක්වන්න.
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

15. ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් නාමික විධායකය හා සත්‍ය විධායකය හඳුන්වන නිල නාමයන් පිළිවෙලින් දක්වන්න.
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

16. සමානුපාතික නියෝජන ව්‍යූහයේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

17. දෝශාභියෝගය හා විශ්වාසභංගය අතර ඇති වෙනස්කම් 2ක් සඳහන් කරන්න.
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

18. ශ්‍රී ලංකාවේ අයිතිවාසිකම් ත්‍ත්‍ත්‍ත්‍ග කරන ආයතන දෙකක් වනුයේ
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

19. 1972 ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නවාංග 2 ක් සඳහන් කරන්න.
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

20. සාර්ක් සංවිධානය විසින් අත්සන් තබා ඇති ගිවිසුම් 2 ක් සඳහන් කරන්න.
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

- **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න 04කට පමණක් පිළිතුරු ලියන්න.**

## B - කොටස

1. දේශපාලන විද්‍යාව සමාජීය විද්‍යාවක් ලෙස සැලකේ. සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

2. පහත දැක්වන මාතෘකා වලින් 02 ක් පිළිබඳව සාකච්ඡා කරන්න.
   - i. ඒකීය සහ සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතර වෙනස්කම් කවරේද?
   - ii. සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් හා අයහපත් ලක්ෂණ සාකච්ඡා කරන්න.
   - iii. සන්ධීය ක්‍රමය සහ සහසන්ධීය ක්‍රමය අතර වෙනස පැහැදිලි කරන්න.
   - iv. සන්ධීය රාජ්‍යයක මධ්‍යම ආණ්ඩුවේ භූමිකාව පැහැදිලි කරන්න.

(ලකුණු 10 x 2)

3. පහත දැක්වෙන ඒවායින් දෙකක් සාකච්ඡා කරන්න.
   - i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යයන්
   - ii. අධිකරණයේ ස්වාධීනත්වය
   - iii. රාජ්‍ය පිළිබඳව ලිබරල්වාදී හෝ මාක්ස්වාදී මතය
   - iv. ආණ්ඩුවේ බලය සංවරණය කරන මාර්ග

(ලකුණු 10 x 2)

## C - කොටස

1. කෝල්බෲක් හා කැමරන් ප්‍රතිසංස්කරණ හේතුකොට ගෙන ඇතිවූ වෙනස්කම් පිළිබඳව ඔබ කැමති මාතෘකා දෙකක් පිළිබඳව සාකච්ඡා කරන්න.
   - i. ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම්
   - ii. සමාජ ක්ෂේත්‍රයේ පරිවර්තනයන්
   - iii. දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම්
   - iv. අධිකරණ ක්ෂේත්‍රයේ ඇතිවූ වෙනස්කම්

(ලකුණු 10 x 2)

2. පහත දැක්වෙන ඒවායින් ඕනෑම 2ක් විභාග කරන්න.
   - i. ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ විධායක කාරක සභාවන්හි ක්‍රියාකාරිත්වය
   - ii. සුළු ජන කොටස් සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සැපයූ ආවරණ
   - iii. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ව්‍යවස්ථා අධිකරණ
   - iv. 1978 ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ විධි විධාන

(ලකුණු 10 x 2)

3. පහත සඳහන් ඕනෑම දෙකක් විභාග කරන්න.

i. 1978 ව්‍යවස්ථාවට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල හා කාර්යයන්

ii. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් ඇති කරන ලද වෙනස්කම්

iii. 1972 හා 1978 ව්‍යවස්ථාවන්හි ව්‍යවස්ථාදායකය - විධායක සම්බන්ධතා

iv. 1978 ව්‍යවස්ථාවට අනුව පළාත් ආණ්ඩුවරයා හා මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධතාවයන්

(ලකුණු 10 x 2)

4. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව සාකච්ඡා කරන්න.

i. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය

ii. සාක් සංවිධානයේ අරමුණු හා කාර්යයන්

iii. පොදු රාජ්‍ය මණ්ඩලයේ අරමුණු හා කාර්යයන්

iv. ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ කාර්යයන්

(ලකුණු 10 x 2)